## පහන් වැට



## දායය සුසැදූ නා සමිඳු

**ජගත් වෙන්තසිංහ**

ජාතික සටන තුළ මහ පෙළහර පැවේ
දායක වෙමිනි සිදු කොට විය යුතු සේවේ
නායක සමිඳුනෙනි ගරු මාදුළුවේ
මේලක ඔබෙනි යළි යහමග කට අවේ

කළු කොදයාව මඩිගේ ඇස් මිහිඳු ගරු
යතිවරු කුඩාපොල හිමි දූය අවදි කෙරු
කළ මහා සටන ගෙන ගිය ජය ලබන තුරු
සෙන්පති ඔබය හිමි අරහන් දජය දූරු

රස ඔවදනින් යුතු නිබදව දෙසුණු බණේ
තැනට ඔබින ලෙෂ තැනටම වැදුණු ඇණේ
ඔබ ගුණ සුවඳ සුරලොව වෙත ඇදුණු දිනේ
අසරණ වුණෙමු අපි අද හාමුදුරුවනේ

රදවා මුවෙහි හොඳ පියකරු සිනාවක්
පවසන අයුරු හරබර දේසනාවක්
අහගෙන සිටින්නට ලැබ වාසනාවක්
විමසා බලමි හිමිසද ගිය දිහාවක්

යන එන සියලු තැන හිමිරුව මැවීයන්
රන්සර වදුර බණපද යළි ඇසීයන්
කළ පින් මහිම හිමි ළග ගොඩ ගැසීයන්
මගෙ හිමි සඳුන් ඔබ නිවනින් නිවීයන්

## තනිකම

**ප්‍රේමවංශ දසනායක**

දෙපා නඟමි හුරු මං පෙත නැත ඔබ අද මගෙ දැහැනේ
දෙනෝ දහක් සිටියද මඟ තනිකම මා වට රැඳුනේ
බලාපොරොත්තුව ලුහුබැඳ අප යන මේ දිවි ගමනේ
නිමා නොවන ආදරයක් කෙලෙසක නම් හද රැඳුනේ

වලා ගැබින් එබී බලන සරා සඳක් ලෙස එදිනේ
සිනා කැලුම් මුව හොබවා ඉනා බසින් දෙඩු වදනේ
සදාකාලිකැයි කියැවුනු ආදරයේ තුරු මුදුනේ
පියා සලා රඟ දුන් ඔබ නිලියකි අද මගෙ සිහිනේ

අමාවකට බැස යන සඳ රැස් කලඳක් බිම අතුරා
වසා පැතිරෙනා අඳුරට ඈත ඉඳන් අත වැනුවා
දයා නෙතින් බලා සිටිය තනි තරුවක් ගුවන අරා
මලානිකව දිගුවන රැය දැක සෝ සුසුමක් හෙලුවා

ගලා හැලුන දිය දහරක් සිළී වියලි යන විලසේ
ඔබේ සිනා සොමි සඳකැන් මැකී නොපෙනි ගිය දවසේ
විඩා නෙතින් බලා සිටින හිස් බැල්මක දුර අහසේ
පෙනී නොපෙනි යයි මට ඔබ දිලී නිවෙන තරුවක් සේ

## එකමත් එක දවසක්...

**ප්‍රනීත් කාරියවසම්**

අප එවා ඇත
වරක් පමණක්
මේ පොළොව මත
කෙටි දුරක් ඇවිද යාමට
සතුටුවෙමි.

එම කෙටි දුරින්
බොහෝදුර මා පැමිණි පසු
අප එකට.
දිලිසෙන පියවර කීපයක්
ගමන් කල බැවින්

සිහින් මීදුමට
අතුරුදන් වන්න පෙර ඔබ
මගේ ජීවිතය
එම දිලිසෙන පියවර කීපයයි.......



## අම්මා මලක් නොව....

**නිලංක මහේෂාන් ප්‍රනාන්දු**

අඹෙන් ඉපිද කුලගෙට වැඩිය ගිනි පිට
ඒ වග ලියනු බෑ හොඳ මදිය මගෙ කට
කෙතරම් පතන මුත් බුදු නොවන අද හෙට
එන කල්පෙටත් යෙදුණ වැඩ ඇත මවකට

දර හෝ ගෑස් වෙනසක් නැතිව උදයට
උණුසුම දේ ය බැස යන සඳේ සීතට
ලොවක් පුබුදවා තේ කෝපි කහටට
සීනුව වයයි නැග එන්න නැවුම් ඉරකට

සාරිය, ගවුම නම පමණි ඇත්තෙ වෙනසට
මවකගෙ සතුට නැතුවාද වතක හිර කොට
වැඩ වැරුමක් කළොත් මව්වරුන් දිනකට
සිය සිය දහස් කුස් හිස්වේවි හනිකට

අම්මා මලක් නොව පේරාදෙණිය මට
නෙළා පුදනු කෙලෙසද සිරි පතුල් පිට
හැකි නම් සැණින් මම නඟිමි සදෙව් ලෝකෙට
එක් සුර කයක් බන්දමි එක් මවකට

කව්ය ලොප් කරමි ලෝ සදාචාරෙට
දෙතන් හස කළෝ කවියන් අවාරෙට
සා පැටවුනේ මව් සඳ ඉරා මිහි බට
ඒ ණය ගෙවා, සැරසෙමු දෙවනු නිවනට

## ජයග්‍රහණය

**අසෝකා දේවසුරේන්ද්‍රා**

ලෝරියන්ට් ප්‍රංශය

ඔබෙ වදනින් හිත රිදුණත්..
වෛරය නම් නැත මා හද,
කොතරම් ආදරය උනත්*
මිනිස් සිතක වෙනසක් හැටි,
කියා දුන්නෙ නුඹ හිමියනි....

සිත රිදුනත් නුඹෙ වදනින්,
සවියක් විය ලොව දකින්න,
කලකිරුණෝ නැහැ මා සිත..
ලෝක දහම දැණුනා මිසැ

සංසාරෙන් එතෙර වන්න
මගේ හිතට සවියක් වුනු,
නුඹේ රුදුරු වදන් පෙළට.........

සංසාරෙන් එතෙර වන්න
නුඹ මට ලැබ දුන් සහයට
මේ පින් නුඹටත් උරුමයි
හිමියනි සැමදා

## පාපොච්චාරණය ඇගේ

ආශා පෙරේරා



**තෙල් කළදක් නැති කුප්පි ලාම්පුව
කෑළි කපන අඳුරට එක්වී
මෙලවු දවසක් මතකෙකවත් නැති
ලිප හිටියෙත් උරණව ගොළුවී
කිරි වැරුවෙත් නැති දෙතොළ තෙමන්නට
කිරි කදුළක් නැති ලැම හිස්වී
අහස උසට නැගි අගහිගකම් ලග
සිහින ගියා සුළගට විසිරී**

**සත්සමුදුරකින් එහා ඉගිල්ලී
තනි උනුදා මේ දිවි කතරේ
සීමා මායිම් නැතිව සරන්නට
තටු ලැබුනේ නෑ හිමි සදුනේ
ඇස් ඉස් මස් ලේ නහර ඇදුම්කන සෙනෙහස
ඇවිලුණ හද පතුලේ
වරදක් උනි ණම් සමාදෙන්න මට
හැකි වෙද මතු උපදින සසරේ**

**ලෝ අපවාදෙන් හිත රිදුනොත් මතු
නුඹ ලෝකය දකිනා දවසේ
තුන් හිතකින්වත් වෛර කරන්නට
එපා මගේ රන් කැටි පුතුනේ
කිසි කල නොදුටුව නැවුම් ලොවක නුඹ
රජ කරවන්නට දුටු සිහිනේ
බිඳී ගියා එක ගලින් ගලට ලේ
ගලා ගියෙන් නිරුදක කතරේ**